ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව– 2011

-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------

1.1 මතය ව්‍යාචනය

-----------

මෙම වාර්තාවේ 1.2.1, 1.2.2, 1.2.3 සහ 1.2.4 ඡේදවල දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතය සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොටගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

-------------------------------

| ගිණුම්කරණ ප්‍රමිතවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලං. ගි.ප්‍ර. අංක 05 | සියළුම තොග ගණනය කර ගිණුම් ගත කළ යුතු වුවත් තොග අයිතම 24 ක තොග වටිනාකම අවසාන තොගයට ගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලං. ගි.ප්‍ර. අංක 09 | i. කාරක ප්‍රාග්ධන වෙනස්වීම් ගැලපීමේදී ජංගම වත්කම් වැඩිවීම මුදල් ප්‍රවාහයෙන් අඩු කළ යුතු වුවත් එකතු කර තිබුණි.<br>ii. ආදායම් බදු ගෙවීම, පාරිතෝෂික වියදම් ගෙවීම මුදල් ප්‍රවාහයේ පෙන්වා නොතිබුණි.<br>iii. අඩමාන ණය වෙන් කිරීම ගලපා නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලං. ගි.ප්‍ර. අංක 10 | හඳුනා නොගත් ණයගැති ශේෂ ගිණුම් වලින් කපා හැරීම පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි. |
| (ඈ) ශ්‍රී ලං. ගි.ප්‍ර. අංක 18 | අත්පත් කර ගන්නා සහ බැහැර කරන ස්ථාවර වත්කම් සඳහා වූ ක්ෂය ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි. |

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) වර්ෂයේ ලාභය ගණනය කිරීමේදී කාර්යාල උපකරණ ක්ෂය රු. 739,534 කින් අඩුවෙන් ද මෝටර රථ වාහන ක්ෂය රු. 182,700 ක් වැඩියෙන් ද දක්වා තිබුණි.

(ආ) වාහන අනතුරක් වෙනුවෙන් ලද රක්ෂණ වන්දි මුදල රු.124,475 ක මුදල අදාල වාහන අළුත්වැඩියා වියදමට ගලපනවා වෙනුවට ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඇ) වෙළඳ ණයගැති ශේෂය තුල ඇතුලත්ව තිබු රු. 68,683 ක පරිත්‍යාග කරන ලද ඖෂධ වල වටිනාකම එකී ගිණුමෙන් ඉවත්කරනවා වෙනුවට නිමි තොග ගිණුම බැර කිරීම හේතුකොටගෙන එම ප්‍රමාණයෙන් ණයගැති ශේෂය වැඩියෙන්ද නිමි තොග අඩුවෙන්ද ගිණුමේ පෙන්වා තිබුණි.

(ඈ) කුලී පදනම මත ජාතික පශු සම්පත් මණ්ඩලයෙන් ලබා දී ඇති කිරිහලේ ආදායම වන රු. 40,800 ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) පරිත්‍යාග වශයෙන් ලැබී තිබු ඖෂධ අමුද්‍රව්‍ය වලින් රු. 499,155 ක් වටිනා ඖෂධ භාවිතයට ගත නොහැකිව තිබු හෙයින් එම වටිනාකම වියදමක් ලෙස නොදැක්වීම නිසා ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) දැන්වීම් හා ප්‍රචාරන ගාස්තු, තොග සමීක්ෂණ දීමනා හා ණයට විකුණුම් පිළිවෙලින් රු. 98,134 ක්, රු. 426,462 ක් හා රු. 142,204 ක් වැඩියෙන් දක්වා තිබුණු අතර ආර්ථික සේවා ගාස්තු වියදම රු. 22,007 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) ස්ථාවර තැන්පතු පොලි ආදායම රු. 488,715 ක් වැඩියෙන් දක්වා තිබීම නිසා එම ප්‍රමාණයෙන් ලාභය වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) වෙළඳ ණයහිමියන් තුල රු. 213,456 ක ස්ථාවර වත්කම් ණය හිමියන්ගේ ශේෂද ඇතුලත්ව තිබුණි.

(එ) පෙර වර්ෂයේ ගැලපුම් ගිණුමේ වර්ෂය ආරම්භයට දැක්වෙන රු. 23,027,136 ක ශේෂයට ගිණුම් 09 කට අදාල රු.2,559,308 කට හර ශේෂ හා ගිණුම් 13 කට අදාල රු. 24,803,946 ක බැර ශේෂද හඳුනා ගැනීමකින් තොරව ගලපා තිබුණි.

1.2.3 නොසැසඳුනු ගිණුම්

-------------

මෙහෙයුම් නොවන ආදායම් යටතේ ගිණුම් ගත කර ඇති අලෙවිසැල් ආදායම් වටිනාකම්වල මාසික අලෙවි වාර්තා අනුව පහත සඳහන් වෙනස්කම් දක්නට ලැබුණි.

| සේවා ආදායම | අලෙවි වාර්තා අනුව | ගිණුම අනුව | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| විජේරාම අලෙවි මධ්‍යස්ථානය | 2,299,550 | 2,151,350 | 148,200 |
| ගාල්ල අලෙවි මධ්‍යස්ථානය | 25,200 | 12,160 | 13,040 |
| කොළ කැඳ ආදායම | 424,955 | 412,435 | 12,520 |
| ඔසු පැන් | 38,680 | 35,960 | 2,720 |
| දේශීය සහල් | 56,130 | 17,119 | 39,011 |
| අලෙවි මධ්‍යස්ථාන විකුණුම් | 35,118,743 | 33,984,198 | 1,134,545 |

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| විෂයයන් | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ප්‍රසාද දීමනා සඳහා වෙන් කිරීම | 59,375 | විස්තරාත්මක උපලේඛන |
| නශ්‍ය වූ භාණ්ඩ සඳහා වෙන් කිරීම | 2,213,229 | උපලේඛන |
| සේවය අහිමි සේවක වන්දි ප්‍රදානය | 1,131,347 | එම |
| 2005 ට පෙර ආදායම් බදු ප්‍රතිපාදන | 8,015,988 | එම |
| වෙන් කිරීම් | 37,829,242 | විස්තරාත්මක වාර්තා |
| පෙර වර්ෂ ගැලපුම් ගිණුම | 271,126 | වවුචරපත් |
| ගෙවල් කුලී අත්තිකාරම් | 750,797 | උපලේඛන |
| ලැබිය යුතු ආදායම් | 24,653,149 | ශේෂ සනාථ කිරීම් |
| ණයගැතියෝ | 50,823,731 | කම්හල් පිරිවැය ගණනය කළ ආකාරය |
| නිමි තොගය | | |

### 1.2.5 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි සංග්‍රහය (මු.රෙ) | |
| | මු.රෙ. 316 | නාවින්න අලෙවි මධ්‍යස්ථානයෙහි දැනට නිකුත් නොකළ විශාල බිල්පොත් ප්‍රමාණයක් අනාරක්ෂිතව තිබුණි. |
| | මු.රෙ. 341 | නාවින්න අලෙවි සැලෙහි බිල් පොත් ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ ලේඛන පවත්වා නොගැනීම. |
| | මු.රෙ. 396 (ඈ) | මාස 06 ඉක්මවූ රු. 218,872 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| | මු.රෙ. 1645 (අ) | වාහන ලොග් පොත් අසම්පූර්ණව පවත්වාගෙන යාම. |

| | | |
|---|---|---|
| | මු.රෙ. 1647 (ඉ) සහ මු.රෙ. 11 කාණ්ඩයේ vi. උපලේඛනය. | ආයතනය සතු වාහන සම්බන්ධයෙන් වාහන ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. |
| | 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | රජයේ වාහන වලට රාජ්‍ය ලාංඡනය යෙදිය යුතු වුවත්, 59-3140 කැබ් රථය හා 253-9314 දරන වෑන් රථයෙහි නිල ලාංඡනය සටහන් කොට නොතිබුණි. |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | |
| | 8.3.3.1 ඡේදය | භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව සංස්ථාවේ සේවකයන්ට සමාලෝචිත වර්ෂය තුල දිරි දීමනා වශයෙන් රු. 25,170,347 ක් ගෙවා තිබුණි. |
| | 9.2 ඡේදය | මානව සම්පත් කළමනාකරු 11 ශ්‍රේණිය සහ මුදල් කළමනාකරු 11 ශ්‍රේණිය සඳහා පුවත්පත් දැන්වීම් පලකරමින් ඒ සඳහා රු. 252,392 ක් වැය කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයටද මෙම පුරප්පාඩු පුරවා නොතිබුණි. |
| (ඇ) | 2006 ජනවාරි 25 දිනැති එන්පීඒ 8 දරන ජාතික ප්‍රසම්පාදන ඒජන්සියේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 5.3.11 වගන්තිය. | තල තෙල් සම්බන්ධ ටෙන්ඩර ක්‍රියාවලියේදී ලංසු සුරක්ෂණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | 3.5 වගන්තිය. | තලතෙල් මිලදී ගැනීමේදී එක් සැපයුම්කරුවකුගෙන් ඍජු මිලදී ගැනීමක් කර තිබු අතර එහිදී අදාල නියමයන්ට පටහැනිව කටයුතු කර තිබුණි. |
| | 5.4.8 වගන්තිය | I. රු.10,254,750 ක් වටිනා තල තෙල් කි.ග්‍රෑ. 30250 ක් මිලදී ගැනීමේදී කාර්ය සාධන බැඳුම් කර ලබා ගෙන නොතිබුණ අතර ගිවිසුම් ගත සැපයුම ඉටුකර නොතිබුණි.<br>II. 2010 වර්ෂයේ දී නැව්ගත කිරීමට පෙර නියැදි ප්‍රතික්ෂේප වු එහෙත් ආනයනය කරන ලද රු. 485,036 ක් වටිනා අසමෝදගම් වෙනුවට රු. 485,033 ක් වටිනා කුංකුමප්පු ගෙන්වා ගෙන ඇති අතර මෙය ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ඈ) | 1990 පෙබරවාරි 19 දින සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශ ලේකම් ගේ ලිපිය | නෛතික කටයුතු නීතිපතිවරයා මගින් ඉටු කරගත යුතු වුවද නඩු සඳහා රු. 276,768 ක බාහිර නිතිඥයන්ට ගාස්තු ගෙවා තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය, බදුවලට පෙර රු. 63,878,705 ක ශුද්ධ ලාභයක් වූ අතර, එය ඉකුත් වර්ෂය සඳහා බදුවලට පෙර ශුද්ධ ලාභය වූ රු.6,016,390 සමඟ සැසඳීමේදී රු. 57,862,315 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. කෙසේ වුවද මෙහෙයුම් නොවන ආදායම ගණන් ගැනීමට පෙර සමාලෝචිත වර්ෂයේ දී සංස්ථාව රු. 48,536,407 ක ශුද්ධ ලාභයක් ලබා තිබුණි. ඉකුත් වර්ෂය සඳහා මෙහෙයුම් නොවන ආදායම වූ රු. 5,646,893 ගණන් ගැනීමට පෙර ශුද්ධ ලාභය රු. 369,497 ක් විය. සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභයේ වැඩිවීම රු. 57,862,315 ක් වූ අතර අවසාන තොග රු. 31,876,686 කින් වැඩිවීම, අමුද්‍රව්‍ය පරිත්‍යාග වශයෙන් රු.10,695,200 ක් ලැබීම සහ සමාලෝචිත වර්ෂයේදී ඖෂධවල විකුණුම් මිල වැඩි කිරීම එයට බලපෑ ප්‍රධාන හේතූන් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(රුපියල් දහස් වලින්)

| | 2011 | 2010 | වෙනස | ප්‍රතිශත |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| විකුණුම් | 358,677 | 316,029 | 42,648 | 13.4 |
| විකුණුම් පිරිවැය | 201,333 | 288,488 | (87,155) | (30.2) |
| දළ ලාභය | 157,344 | 87,540 | 69,804 | 7.97 |
| දළ ලාභ ආන්තිකය | 43.87 | 27.70 | 16.17 | 58.38 |
| මෙහෙයුම් නොවන ආදායම් | 15,200 | 5,108 | 10,092 | 197.57 |
| ආයතන හා පරිපාලන වියදම් | 78,225 | 63,043 | 15,182 | 24.08 |
| විකුණුම් හා බෙදාහැරීම් වියදම් | 30,859 | 21,389 | 9,470 | 44.27 |
| ජංගම වත්කම් | 281,309 | 231,880 | 49,429 | 21.31 |
| ජංගම වගකීම් | 45,793 | 65,412 | 19,619 | 29.99 |
| ලාභය මත ආදායම් බදු | 18,524 | 1,203 | 17,321 | 1439.8 |
| බදු අඩුකල පසු ලාභය | 45,353 | 4,813 | 40,540 | 842.3 |

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

| ද්‍රවශීලතා අනුපාත | සම්මත අනුපාතය | 2011 | 2010 |
|---|---|---|---|
| ජංගම අනුපාතය | 2:1 | 6.14:1 | 2.29:1 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 1:1 | 3.66:1 | 5.24:1 |
| තොග පිරිවැටුම් අනුපාතය (වාර) | | 4.73 | 6.6 |

ඉහල ද්‍රවශීල අනුපාතයන් නිරීක්ෂණය වූ අතර කාරක ප්‍රාග්ධනය තුල කෙටිකාලීන ආයෝජනයක් පැවතීම හේතුකොටගෙන අතිරික්ත කාරක ප්‍රාග්ධන තත්ත්වයක් පෙන්නුම් කර ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංස්ථාවේ සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත නිෂ්පාදන පිරිවැය රු. 343,598,676 ක් වූ අතර තථ්‍ය නිෂ්පාදන පිරිවැය රු. 247,289,253 ක් විය. ඇස්තමේන්තුගත නිෂ්පාදන ඒකක හා තථ්‍ය නිෂ්පාදන ඒකක අතර පහත පරිදි විචලනයක් නිරීක්ෂණය විය.

| නිෂ්පාදනය | ඇස්තමේන්තුගත නිෂ්පාදනය | තත්‍ය නිෂ්පාදනය | හිතකර/ අහිතකර විචලනය | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | ඒකක | ඒකක | | % |
| අරිෂ්ඨ (මි.ලි. 750 බෝතල්) | 230,400 | 140,351 | (89,949) | (39) |
| ආසව (මි.ලි.750 බෝතල්) | 148,800 | 124,483 | (24,317) | (16) |
| චූර්ණ (ග්‍රෑම්) | 34,094 | 23,823 | (10,271) | (30) |
| කල්ක ලේහ (ග්‍රෑම්) | 21,445 | 18,606 | (2,839) | (13) |
| නව නිෂ්පාදන | 11,884 | 5,050 | (6,834) | (57) |
| ක්වාත (මි.ලි. 750 බෝතල්) | 131,639 | 71,603 | (60,036) | (46) |
| රස (ග්‍රෑම්) | 3,402 | 1,978 | (1,424) | (42) |
| සිරප් (මි.ලි 750 බෝතල්) | 32,797 | 21,812 | (10,985) | (33) |
| තෙල (මි.ලි 750 බෝතල්) | 176,226 | 134,490 | (41,736) | (24) |
| වටි ගුගුල් (ග්‍රෑම්) | 18,772 | 12,114 | (6,658) | (35) |

(ආ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ ඇස්තමේන්තුගත විකුණුම්, තත්‍ය විකුණුම් හා සැසඳීමේදී පහත සඳහන් පරිදි අපේක්ෂිත ඉලක්ක අත්පත් කරගෙන නොතිබුණි.

| | ඇස්තමේන්තුගත විකුණුම් | තත්‍ය විකුණුම් | අහිතකර විචලනය | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| රාජ්‍ය අංශය | 337,992,008 | 247,591,997 | (90,400,011) | (27) |
| පෞද්ගලික අංශය | 124,311,000 | 111,085,939 | (13,225,061) | (11) |
| සමස්ථ විකුණුම් | 462,303,008 | 358,677,936 | (103,625,072) | (22) |

(ඇ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී පහත සඳහන් නිෂ්පාදනවල අලෙවිය සමාලෝචිත වර්ෂයේදී අඩු වී තිබුණි.

| නිෂ්පාදන | 2011 වර්ෂය | 2010 වර්ෂය | වෙනස | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | (ඒකක) | (ඒකක) | (ඒකක) | % |
| අරිෂ්ඨ | 125362 | 159576 | (34214) | 21.40 |
| ආසව | 109512 | 148595 | (39083) | 26.30 |
| ලේහ | 7472 | 9031 | (1,559) | 17.26 |
| චූර්න | 64574 | 67848 | (3274) | 4.83 |

(ඈ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී සියළුම නිෂ්පාදන වර්ගවල මිල 10% කින් වැඩි කර තිබීම අලෙවි ආදායම ඉහල යැමට හේතු වී තිබුණි. එසේ වුවද ප්‍රධාන නිෂ්පාදන වන අරිෂ්ඨ, ආසව, ලේහ හා චූර්ණවල නිෂ්පාදන අලෙවිය පහල ගොස් තිබූ අතර නව නිෂ්පාදන වල අලෙවිය ඉහල ගොස් තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය මිල ඉහල යෑම මත සිදුවීමක් වන අතර කාර්යක්ෂමතාවය නිසා සිදුවීමක් නොවූ බව නිරීක්ෂණය විය.

3.2 නිශ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්

(අ) රු. 1,971,201 ක මුළු වියදමින් ස්ථාපනය කර තිබූ ගිණුම්කරණ මෘදුකාංගය ගිණුම් කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි. තවද ඒ සඳහා වාර්ෂිකව සේවා වියදම වශයෙන් රු. 133,669 ක් ගෙවා තිබුණි.

(ආ) වයින් නිෂ්පාදනය සඳහා සංස්ථාව විසින් රු. 1,011,767 ක් වටිනා බෝතල් 24,780 ක් සහ රු. 667,500 ක් වටිනා කිරල මූඩි 30,000 ක් මිලට ගෙන තිබුණ අතර පවතින නිෂ්පාදන ධාරිතාවට අනුව එය වසර 17 ක කාලයකට ප්‍රමාණවත් ව තිබුණි.

3.3 ආර්ථික නොවූ ගනුදෙනු

අශුද්ධ රසදිය සඳහා වාර්ෂික අවශ්‍යතාවය වෙනුවෙන් ප්‍රසම්පාදන මණ්ඩලය අනුමත කර තිබූ ප්‍රමාණයට වඩා වැඩිපුර කිලෝ 43 ක් මිලදී ගෙන ඒ වෙනුවෙන් රු. 416,130 ක මුදලක් වැය කර තිබුණි.

3.4 හඳුනා ගන්නා ලද පාඩු

(අ) අවම මිල ගණන් එවා තිබූ එහෙත් සාම්පල් ප්‍රතික්ෂේප කර තිබූ අනෙකුත් සැපයුම් කරුවන්ගෙන් හා සාර්ථක ටෙන්ඩර්කරුගෙන් තල තෙල් ලබා ගැනීමට කටයුතු නොකිරීම නිසා රු. 1,047,270 ක ඇස්තමේන්තු ගත පාඩුවක් සිදුවී තිබුණි.

(ආ) තල තෙල් මිලදී ගැනීම සඳහා රු. 339 ක් සහ රු. 349 ක මිල ගණන් ඉදිරිපත් කරන ලද සැපයුම් කරුවන් ප්‍රතික්ෂේප කර රු. 352 ක මිල තෝරාගැනීමෙන් සිදුව තිබූ තක්සේරු ගත අලාභය රු. 393,250 කි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ඔසු උයන් වලින් ලද අලාභය රු. 1,357,498 ක් විය.

(ඈ) රු. 119,536 ක් වටිනා අමෘතාරිෂ්ඨය නියමිත ප්‍රමිතියෙන් නිෂ්පාදනය නොවීම මත භාවිතයට නොගෙන ගබඩාවේ තබා තිබුණි.

(ඉ) රු. 199,777 ක් වටිනා කාමේෂ්වරී මෝදකය භාවිතයට ගත නොහැකි ලෙස විනාශ වී තිබුණි.

(ඊ) වාර්ෂික ප්‍රසම්පාදන මණ්ඩල තීරණයට අනුව ඖෂධ අමුද්‍රව්‍ය මිලදී ගැනීමේදී වර්තමාන වෙළඳපල මිල සලකා බැලිය යුතු වුවද සුදු එණු මිලදී ගැනීමේදී පවතින වෙළඳ පල මිල නොසලකා හැරීමෙන් රු. 75,000 ක මූල්‍යමය පාඩුවක් සිදුවී තිබුණි.

(උ) රාජකාරි වැඩ තහනම් කරන ලද සේවකයකු විසින් පවරන ලද නඩුවක තීන්දුව අනුව රු. 2,380,500 ක් ගෙවීමට සිදුව තිබුණි.

(ඌ) වර්ෂයේ අණවුම් දිනය ඉක්මවා සැපයුම් කරන ලද ඖෂධ අමුද්‍රව්‍ය වලට අය කල යුතු රු. 33,832 ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.

(එ) රු. 4,736,916 ක කල්ගතවූ ණය ගැතියන් පොත් වලින් ලියා හැරීම සඳහා භාණ්ඩාගාරය විසින් දක්වා තිබූ කොන්දේසි හා අවශ්‍යතාවලට අනුකූල නොවී බොල් ණය ප්‍රතිපාදන වලින් රු. 4,305,720 ක් ද වර්ෂයේ ලාභයෙන් රු. 431,196 ක් ද ලියා හැර තිබුණි.

(ඒ) වසර 20 ක කාලයක සිට පැවත එන බැංකුවේ තැන්පත් කල එහෙත් උපලබ්ධි නොවූ රු. 898,187 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් ක්‍රියා කර නොතිබුණි.

3.5 ප්‍රමාද වූ ව්‍යාපෘති

-----------

(අ) 2011 වර්ෂයේ විද්‍යාගාර පරීක්ෂණ සඳහා ආයුර්වේද පර්යේෂණායතනයෙන් ආයුර්වේද ඖෂධ සංස්ථාවට ලබා දී තිබූ රු. 141,667 ක මුදල ව්‍යාපෘති කටයුතු සඳහා යොදවා නොතිබුණි.

(ආ) පහත ව්‍යාපෘති ආරම්භ කර අතරමග නවතා තිබුණි.

| | වටිනාකම රු. |
|---|---|
| රජරට නිෂ්පාදනාගාරයේ ඉදිකිරීම | 1,775,095 |
| ගබඩා සංකීර්ණය ඉදිකිරීම | 225,056 |

3.6 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------

මූල්‍ය කළමනාකරු, අභ්‍යන්තර විගණක හා සැපයුම් කළමනාකරු යන තනතුරු පිරවීමකින් තොරව එම තනතුරුවල රාජකාරි ආවරණය කිරීම සඳහා වෙනත් කළමනාකරුවන් පත් කර තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

------------------------

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------

2003 ජූනි 02 දින හා අංක පීඊඩී/12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුල විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සංස්ථාව විසින් ගිණුම් ඉදිරිපත් කරන ලද්දේ 2012 අප්‍රේල් 05 දින දීය.

5. පද්ධති හා පාලනයන්

--------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගබඩාකරණය හා තොග පාලනය.

(ආ) අලෙවි මධ්‍යස්ථාන වල විකුණුම්

(ඇ) පිරිවැයකරණය

(ඈ) සේවක මණ්ඩල කළමනාකරණය

(ඉ) නිෂ්පාදන දිරි දීමනා

(ඊ) ගිණුම්කරණ මෘදුකාංග පැකේජය භාවිතය